සැ.යු .- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2015.12.31 වැනි දින දක්වා ලියාපදිංචි පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,962 - 2016 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2016.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 272 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 273 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 275 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 276 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ.යු .- රුහුණු උදානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


271 – B 081046 —402 (2016/04)
A 1-

# ජනාධිපතිතුමා විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 212

MOD/DEF/2/1/RET/1045.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් නරේන්ද්‍ර කෞෂාල් ද සිල්වා අබේවීර ගුණසේකර, ගැහේබ (නි/63031)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

04 - 519

---

2016 අංක 213

MOD/DEF/2/1/RET/1040.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ලසන්ත සුජීව මාලේවන විතානගේ, ශ්‍රීලයුයුබ (නි/62970)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

04 - 520

---

2016 අංක 214

MOD/DEF/03/02/PRO/RNF/01/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2012 ජනවාරි මස 25 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) වශයෙන්:*

ලුතිනන් (සිඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සිඉ)] ඉලුඹවිදානආරච්චිලාගේ නිලූෂා මංජුලා පෙරේරා, එන්ආර්සී 1576, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජුලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

04 - 518/2

---

2016 අංක 215

MOD/DEF/03/02/PRO/RNF/01/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2012 පෙබරවාරි මස 14 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන්:*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] රත්නුළු සුරංග ද සොයිසා, එන්ආර්ඊ 1340, ශ්‍රීලංනාහ.

*2012 මාර්තු මස 27 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (විඇ) වශයෙන්:*

ලුතිනන් (විඇ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (විඇ)] මුඩ්ලියර්ගේ හසන්ත කෝසල, එන්ආර්ආර් 1348, ශ්‍රීලංනාහ.

*2012 මැයි මස 29 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්:*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] හෙට්ටි ආරච්චිගේ අසේල ධම්මික හෙට්ටිආරච්චි, එන්ආර්එක්ස් 1589, ශ්‍රීලංනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජුලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

04 - 518/1

2016 අංක 216

MOD/DEF/03/02/VNF/COM.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2013 අප්‍රේල් මස 02 වැනි දින සිට උපදේශණ උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන්:*

කන්කානමලාගේ අචිනි චතුරිකා කරුණාරත්න, එන්වීඑක්ස් 5797, ශ්‍රීලංස්වේනාහ
දිමුතු උදයංගනී පස්කුවල්, එන්වීඑක්ස් 5798, ශ්‍රීලංස්වේනාහ
පූර්ණිමා මනේක පෙරේරා, එන්වීඑක්ස් 5799, ශ්‍රීලංස්වේනාහ
හේවාවසම් මස්සලගේ දොන් දනුෂ්ක ප්‍රදීප් කුමාර, එන්වීඑක්ස් 5800, ශ්‍රීලංස්වේනාහ
ගුණවර්ධන මුදලිනායකගේ විශන්ක පසන් සාරංග ගුණවර්ධන, එන්වීඑක්ස් 5801, ශ්‍රීලංස්වේනාහ
රණසිංහ ආරච්චිගේ නිලන්ත කුමාර, එන්වීඑක්ස් 5802, ශ්‍රීලංස්වේනාහ
කාරියවසම් ගොඩගේ සිසිල් ලංකා චන්ද්‍ර එන්වීඑක්ස් 5803, ශ්‍රීලංස්වේනාහ
කඹුරාවල කංකානම්ගේ දොන් මදු අමාකර රණවීර, එන්වීඑක්ස් 5804, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

04 - 517/2

2016 අංක 217

MOD/DEF/03/02/VNF/COM.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2014 ජුනි මස 05 වැනි දින සිට වැඩබලන උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන්:*

නානායක්කාර ජයවර්ධන ලියනාරච්චි සෙව්වන්දි ලංකා, එන්වීඑක්ස් 5808, ශ්‍රීලංස්වේනාහ
ජගත් වර්ණකුලගේ තරුෂි හංසිකා, එන්වීඑක්ස් 5809, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

04 - 517/1

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 218

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ පී. ඒ. ජී. ප්‍රනාන්දු මහත්මිය 2015 ජුනි මස 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/1

2016 අංක 219

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එච්. ජී. සුමනසිංහ මහතා 2015 අගෝස්තු මස 03 වැනි දින සිට 2016 ජනවාරි මස 26 වැනි දින දක්වා නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, *වැඩබලන* ආනයන අපනයන පාලක ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/2

2016 අංක 220

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ශාන්ත බණ්ඩාර මහතා 2015 ඔක්තෝබර් මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/3

---

2016 අංක 221

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. නාවුකරසන් මහත්මිය 2015 ඔක්තෝබර් මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/4

---

2016 අංක 222

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ජනාධිපති නීතිඥ එම්. එම්. සුහයිර් මහතා 2015 ඔක්තෝබර් මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/5

---

2016 අංක 223

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පී. එම්. අනුර ද සිල්වා මහතා 2015 නොවැම්බර් මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/6

---

2016 අංක 224

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඒ. පී. ජී. කිත්සිරි මහතා 2015 නොවැම්බර් මස 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/7

---

2016 අංක 225

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩබ්ලිව්. එම්. පී. ජී. වික්‍රමසිංහ මහතා 2015 නොවැම්බර් මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මහාමාර්ග රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/8

2016 අංක 226

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩබ්ලිව්. එම්. කේ. එස්. ඩී. විජයබණ්ඩාර මහත්මිය 2015 දෙසැම්බර් මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/9

2016 අංක 227

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මිය 2015 දෙසැම්බර් මස 04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

04 - 453/10

# වෙනත් පත්කිරීම් ආදිය

**2016 අංක 228**

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්කිරීම්

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ඒ. පී. ගුරුගේ මිය 2015.10.05 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්,
2. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ෂන්මුගම්පිල්ලෙයි බාලසුබ්‍රමනියම් මහතා 2015.09.21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්,
3. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. එම්. මොහොමඩ් මිය 2015.11.02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්,
4. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ එස්. එන්. අත්තනායක මිය 2015.11.11 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්,
5. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්. සී. එල්. රුදිගෝ මහතා 2015.11.16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් (කළමනාකරණ) වශයෙන්,
6. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඩබ්ලිව්. ඒ. එල්. වික්‍රමාරච්චි මහතා 2015.11.02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු එවකට මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්,
7. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩබ්ලිව්. එම්. පී. ජී. වික්‍රමසිංහ මහතා 2015.09.21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කළමණාකරණ ප්‍රතිසංස්කරණ හා ඵලදායිතා සංවර්ධන) වශයෙන්,
8. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ආර්. ආර්. එම්. සී. නදීශානි මහත්මිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වශයෙන්,
9. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එන්. වයි. කොහොවල මෙනවිය 2015.10.22 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,
10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ කේ. පී. කාන්ති පෙරේරා මිය 2015.06.29 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වරාය හා නාවික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්,
11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ මේධාවි අබේසේකර මිය 2012.09.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වරාය හා නාවික අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්,
12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ පී. හතරසිංහ මහතා 2015.04.07 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වරාය හා නාවික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්,
13. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඩබ්ලිව්. ඒ. කේ. එන්. වික්‍රමාරච්චි මිය 2015.12.01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වරාය හා නාවික අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,
14. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඩී. එන්. හෙට්ටිආරච්චි මිය 2015.12.03 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්,
15. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඒ. ටී. වික්‍රමගේ මහතා 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයකු වශයෙන්,
16. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඩී. ඒ. එස්. වී. වික්‍රමරත්න මෙය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පාලන) වශයෙන්,
17. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ආර්. එස්. එම්. වී. සෙනවිරත්න මිය 2015.01.18 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්,
18. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ කේ. ඩබ්ලිව්. පී. දයාරත්න මිය 2015.01.18 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්,

19. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එන්. බී. හේමා ධර්මවර්ධන මිය 2015.12.30 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්,
20. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එස්. ඒ. එන්. ආර්. කේ. ජයසිංහ මහතා 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයකු වශයෙන්,
21. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එස්. මාතර ආරච්චි මහත්මිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්,
22. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ආර්. ඩබ්ලිව්. ඩී. චතුරිකා මහත්මිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්,
23. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ඩී. නිල්මිණි මහත්මිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්,
24. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ආර්. ඒ. දේශානි මෙනවිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්,
25. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ ආර්. පී. ඩී. ටී. ලක්මිණී මෙනවිය 2015.11.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්,
26. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ කේ. එච්. එල්. කොඩිතුවක්කු මිය 2016.01.04 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික වැටුප් කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2016 මාර්තු මස 17 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

04 - 432

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1863417
ජයනාත් ග්‍රයින්ඩින් මිල්ස්

2016 පෙබරවාරි මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලබයි.

ගල්කිස්ස ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. සී. එස්. ජයසූරිය විසින් 2011 මැයි මස 05 වැනි දින සහතික කරන ලද අංක 1320, 2011 නොවැම්බර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 1585, 2013 අප්‍රේල් මස 11 වැනි දින අංක 2153 සහ 2014 පෙබරවාරි මස 13 වැනි දින සහතික කරන ලද අංක 2506 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයනාත් ග්‍රයින්ඩින් මිල්ස් යන නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අත්තිඩිය විදානලාගේ නොබට් පෙරේරා සහ අත්තිඩිය විදානලාගේ ජයනාත් නන්දන පෙරේරා යන අය ණයකරුවන් හැටියටත් අත්තිඩිය විදානලාගේ ජයනාත් නන්දන පෙරේරා උකස්කරු හැටියටත් පැහැර හැර ඇති හෙයින් ද,

ගල්කිස්ස ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. සී. එස්. ජයසූරිය විසින් 2014 සැප්තැම්බර් මස 09 වැනි දින සහතික කතර ලද අංක 2790 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයනාත් ග්‍රයින්ඩින් මිල්ස් යන නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අත්තිඩිය විදානලාගේ නොබට් පෙරේරා සහ අත්තිඩිය විදානලාගේ ජයනාත් නන්දන පෙරේරා යන අය ණයකරුවන් හැටියටත් අත්තිඩිය විදානලාගේ ජයනාත් නන්දන පෙරේරා උකස්කරු හැටියටත් පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි හැටඅට ලක්ෂ හයදහස් දෙසිය පනස් දෙකයි ශත පහ (රු. 1,68,06,252.05)ක මුදලක් 2016 ජනවාරි මස 07 වැනි දින වන විට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි හැටඅට ලක්ෂ හයදහස් දෙසිය පනස් දෙකයි ශත පහ (රු. 1,68,06,252.05)ක මුදල අයකර ගැනීම සඳහා සහ එකී රු. 1,54,00,000ක මුදල මත 2016 ජනවාරි මස 08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට 11% වැඩිපුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 1320, 1585, 2153, 2506 සහ 2790 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පළමු හා දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩොප් වීදියේ අංක 200හි 2 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාතලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්වත්ත 529 දරන ග්‍රාම නිලධාරී වසමේ පොල්වත්ත හි පිහිටි මීගහවත්ත කැටකෑලගහවත්ත සහ අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. ගුණසේකර විසින් 2007 අප්‍රේල් මස 27 වැනි දින සාදන ලද අංක 16/2007 දරන පිඹුරේ ලොට් 3 සහ (බලයලත් මිනින්දෝරු බී. එච්. නිහාල් සිල්වා විසින් 2004 මාර්තු මස 07 වැනි දින සාදන ලද අංක 913 දරන පිඹුරේ ලොට් 1 සහ 2 ඒකාබද්ධ කොට නැවත බෙදන ලද ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1 (වෙන්කරන ලද අඩි 5ක් පළල පාර) සහ ලොට් 2න් ද, නැගෙනහිරට : වෙන්කරන ලද පාරෙන්ද (අඩි 10ක් පළල) ද, දකුණට : ලොට් 4 ද සහ බස්නාහිරට : ලොට් 2 සහ වෙන්කරන ලද පාරෙන් ද (අඩි 10ක් පළල) ද මායිම් වූ පර්චස් දහහතරයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 14.2)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියළුදේත් සමග වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු B 21/126 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 16/2007 දරන පිඹුරේ ප්‍රවේශ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය සමගද ඉහත සඳහන් පිඹුරේ දෙපාතම පාරේ පොල්වත්ත නැමති ඉඩම මතින් පාර සඳහා වෙන්කර ඇති මාර්ගය මතින් මාර්ග අයිතියද සමග වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කැස්බෑව නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කාලියම්මහර 580 දරන ග්‍රාම නිලධාරි වසමේ කාලියම්මහර ගමේ හි පිහිටි බෝකුන්දර, මකුළුදූව පාරේ වරිපනම් අංක 171/19 දරන මීගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රෙමරත්න විසින් 2004 ජූලි මස 25 වැනි දින සාදන ලද අංක 4017 දරන පිඹුරේ ලොට් D4A1 සහ (බලයලත් මිනින්දෝරු පී. ජී. ඩී. වීරසිංහ විසින් 2004 අප්‍රේල් 10 වැනි දින සාදන ලද අංක 6989 දරන පිඹුරේ ලොට් D4A සහ D4B ඒකාබද්ධ කොට නැවත බෙදන ලද ඉඩමට මායිම් වශයෙන්, උතුරට : අඩි 10ක් පළල පාර (අංක 6989 දරන පිඹුරේ ලොට් D4E) සමග (D4B1) අළුතින් භාවිතාවන පෙදෙස ද, නැගෙනහිරට : වැටකෙයියගහපොත්ත ඕවිටෙන් ද, දකුණට : සංජීවනී සහ අනිකුත් අයද හිමිකම් කියන අංක 111 දරන පිඹුරේ ලොට් D5 ද, බස්නාහිරට : අංක 6989 දරන පිඹුරේ ලොට් D4C (නිවැරදි කරන ලද) (D4B1) අළුතින් භාවිතාවන පෙදෙසෙන් ද, මායිම් වූ අංක 4017 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ සහ සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව C 199/51 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම පාරක් සඳහා වෙන් කොට ඇති සියලු බිම් කොටස් මතින් ගමන් කිරීමේ ප්‍රවේශ අයිතිය ද සමග පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

කාලියම්මහර හි පිහිටි මීගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ විසින් 1980 නොවැම්බර් මස 17 වැනි දින සාදන ලද අංක 111 දරන පිඹුරේ ලොට් D10 (දත් නගර සභාව මගින් නඩත්තු කර වෙන්කරන ලද පාර) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් D1 ද, නැගෙනහිරට : මෙහි D2, D3, D4, D5, D6, D7 සහ D8 ද, දකුණට : අංක 658දරන පිඹුරේ ලොට් B ද සහ මෙහි ලොට් D 9, බස්නාහිරට : ඉඩමේ හිමිකම් කියන හිමිකරුවන් වන K. D. එළියස්, මීලිනෝනා සහ කුලතුංග සහ පාරෙන් ද මායිම් වූ එකී අංක 111 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්පහයි දශම හයයි හතර (අ. 0, රූ. 0, පර්. 35.64)ක විශාලත්වයෙන් යුක්ත වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍ඉරු C 140/119 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 6989 දරන පිඹුරේ ලොට් D4E (අඩි 10ක් පළල) සහ ලොට් D4D2 සහ අංක 4017 දරන පිඹුරේ ලොට් D4B1 ලෙස ලකුණු කරන ලද පාරක් සඳහා වෙන් කොට ඇති සියලු බිම් කොටස් මගින් ගමන් කිරීමේ ප්‍රවේශ අයිතිය ද සමග වේ.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

04 - 486

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

අහමඩ් ෆලීල් මොහාන්දාස් සහ ජුලියානගේ පූර්ණ චන්දන සිල්වා හවුල්කරුවන් ඔස්ගෝ එන්ටර්ප්‍රයිසස්
ජුලියානගේ පූර්ණ චන්දන සිල්වා තනි අයිතිකරු - මිලන්කෝ මේට්ල් ප්‍රඩක්ට්ස්

2016 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර කර ඇති දේපල කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2011 මැයි මස 30 වැනි දින සහතික කළ අංක 4672 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අහමඩ් ෆලීල් මොහාන්දාස් සහ ජුලියානගේ පූර්ණ චන්දන සිල්වා (හවුල්කරුවන් - ඔස්ගෝ එන්ටර්ප්‍රයිසස්) ණයකරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 නොවැම්බර් මස 30 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් දෙකෝටි පනස්හය ලක්ෂ අසූතුන්දහස් අටසිය හැටපහයි ශත හැට එක (රු.25,683,865.61) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර කර ඇති දේපල කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්ද ා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2012 පෙබරවාරි 16 වන දින සහතික කරන ලද අංක 4974 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජුලියානගේ පූර්ණ චන්දන සිල්වා (තනි අයිතිකරු - මිලන්කෝ මේට්ල් ප්‍රඩක්ට්ස්) ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 නොවැම්බර් මස 30 දිනට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් එක්කෝටි තිස්ලක්ෂ විසිතුන්දහස් අටසිය දහඅටයි ශත අනූ අට (රු.13,023,818.98)ක මුදලක් අයවිය යුතුව හා ලැබියයුතුව ඇති හෙයින්ද,

එකී හිඟ මුදල්වල එකතුව වන තුන්කෝටි අසූහත් ලක්ෂ හත් දහස් හයසිය අසූහතරයි ශත පනස් නමය (රු.38,707,684.59) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 දෙසැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4672 සහ 4974 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රද ානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### ඉහත සඳහන් කළ උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුල වැලිකඩ හි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර මාවතේ වරිපනම් අංක 463/1 දරන ඒදණ්ඩේපිල්ලෑව සහ නෙළුම්වලකුඹුර ඒදණ්ඩේපිල්ලෑව කීනගහවගුර හෙවත් කුඹුර නමැති ඉඩමෙන් බෙදා වෙන් කොට ඇති බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඩබ්. ඩී. පෙරේරා, විසින් 2010 අප්‍රේල් මස 06 වන දින සාදන ලද අංක 010063 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාර, ඇළ සහ රඳවාගැනීමේ පෙදෙසෙන් ද නැගෙනහිරට : අංක පීපී සීඕ 6254 දරන පිඹුරේ ලොට් 09 සහ 11 කොටසෙන්ද දකුණට : බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩංවල විසින් සාදන ලද අංක 3474 දරන පිඹුරේ ලොට් 1සහ ලොට් 8, 7 (අඩි 20 ක් පළල පාර) ශ්‍රී ජයවර්ධනපුර මාවතේ වරිපනම් අංක 475 සහ 467 න්ද සහ බස්නාහිරට : පාරෙන්ද මායිම් වූ එකී අංක 010063 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි පර්චස් විසි එකයි දශම පහයි බිංදුව (අ. 1, රූ. 0, පර්. 21.50) ක විශාලත්වයෙන් ඇති ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමග වේ.

එකී අංක 4672 සහ 4974 දරන උකස් බැඳුම්කරයන් හි දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කොට ඇති බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩංවල විසින් 2000 සැප්තැම්බර් මස 05 වැනි දින සාදන ලද අංක 3474 දරන පිඹුරේ නිරූපිත ලොට් 7 (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) මතින් ප්‍රවේශ අයිතියද සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-500/1

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතියයි.

පරණමාන්නගේ තරංගි බහුශ්‍රාණි මේකලා ඉරුගල්බණ්ඩාර.

2016 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූද 2014 අප්‍රේල් මස 22 වැනි දින සහතික කළ අංක 4849, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් 2014 අගෝස්තු මස 06 දින සහතික කළ අංක 3475 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් 2015 ජනවාරි මස 12 වැනි දින සහතික කළ අංක 5004 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පරණමාන්නගේ තරංගි බහුශ්‍රාණි මේකලා ඉරුගල්බණ්ඩාර යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස් හතරලක්ෂ අසූතුන්දහස් නමසිය දාහතයි ශත අසූ එක (රු.5,483,917.81) ක මුදලක් 2015 අගෝස්තු 21 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,483,917.81 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අගෝස්තු මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 4849, 3475 සහ 5004 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සීමාව තුළ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාවන්තිස්සපුර ග්‍රාම නිළධාරී වසමේ තිස්සමහාරාම හි පිහිටි බෝගහපෙලැස්ස හෙවත් කුරුකුඹියා කන්ද නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ මිනුම්පති විසින් සහතික කරන ලද අංක අ. භූ. පි. 2 දරන පිඹුරේ ලොට් 907 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 902 න් ද, නැගෙනහිරට : ප්‍රධාන පාරක් සඳහා වෙන් කරන ලද මාර්ගයෙන් ද, දකුණට : ලොට් 908 න්ද සහ බස්නාහිරට ලොට් 945 න් ද මායිම් වූ එකී අංක අ. භූ. පි. 2 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසිහය (අ.1, රූ. 3, පර්. 26) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුම දේත් සමඟ වන මෙය හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු එල්ඩීඕ කේ. 04/114 යටතේ ලියාපදිංචි කර ඇත.

මිනුම්පති විසින් සහතික කරන ලද එකී අංක අ. භූ. පි. 2 දරන පිඹුරේ නිරූපිත මාර්ග මතින් ප්‍රවේශ අයිතියද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-500/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - රිකිල්ලගස්කඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

සමරකෝන් මුදියන්සේලාගේ පැරකුම් සමරකෝන්.

2016 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2013 මාර්තු මස 15 වැනි දින සහතික කළ අංක 3094 සහ 2012 ජූලි 23 වැනි දින සහතික කළ අංක 2856 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමරකෝන් මුදියන්සේලාගේ පැරකුම් සමරකෝන් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස් පන්ලක්ෂ හැත්තෑනම දහස් හයසිය හැටදෙකයි ශත විසිපහ (රු.5,579,662.25) ක මුදලක් 2015 දෙසැම්බර් මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී (රු.5,579,662.25) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016 ජනවාරි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 3094 සහ 2856 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින්

ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වළපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ වලපනේ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 505ඒ පදියපැලැල්ල ග්‍රාම නිලධාරි වසමේ කහටදන්ඩ ග්‍රාමයේ පිහිටි කහටදන්ඩේ කුඹුර හෙවත් ගොඩමුනේ කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ප්‍රනාන්දු විසින් පිළියෙල කරන ලද 1993 ඔක්තෝබර් මස 22 වැනි දින අංක 285 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ඩී. බී. සමරකෝන්ගේ ඉන්ධන ගබඩාවේ ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාර (මහනුවර සිට වලපනේ (රාගල නමින්ද හැඳින්වෙන) දක්වා දිවෙන පාරෙන්ද, දකුණට : දිවාරත්න හිමිකම් කියන ගොඩමුන්න ඉඩමෙන්ද, බස්නාහිරට : දිවාරත්න හිමිකම් කියන ගොඩමුන්න ඉඩම සහ ඩී. බී. සමරකෝන් හිමිකම් කියන පිරවුම් හලෙන්ද මායිම් වූ පර්චස් දෙළහයි දශම තුනයි හත (අ. 0, රූ. 0, පර්. 12.37) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියළුදේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-500/3

---

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බුත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් ජයතිලක සහ පුෂ්පරාණි සූරියආරච්චි

2014 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්ද වූ ද 2013 ජනවාරි මස 21 වැනි දින සහතික කළ අංක 4168 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් ජයතිලක සහ පුෂ්පරාණි සූරියආරච්චි යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑනමලක්ෂ අනූඅටදහස් හත්සිය අටයි ශත පනහ (රු.7,998,708.50) ක මුදලක් 2014 පෙබරවාරි මස 28 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 7,998,708.50 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 මාර්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 4168 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ නර්තනගල ග්‍රාම නිලධාරි වසම් අංක 616 සී තුළ මුණගම පිහිටි දික්හේන කොට්ඨාසයේ කොටසක් වන සොරණ ස්ටේට් ප්ලාන්ටේෂන් කලින් යහල කැළේ ගෘප් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් 1984 ජූලි මස 16 දින මැන සාදන ලද අංක 1376 දරන පිඹුරේ ලොට් 327 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 258 (වෙන් කරන ලද පාරෙන්ද) නැගෙනහිරට : ලොට් 328 න් ද දකුණට : ලොට් 326 න් ද සහ බස්නාහිරට : ලොට් 258 (වෙන් කරන ලද පාරෙන්ද) මායිම් වූ බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් 1984 ජූලි මස 16 වැනි දින සාදන ලද අංක 1376 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි එකයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 21.6) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය පානදුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සී 302/110 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-500/4

---

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - තඹුත්තේගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගම්තිහේ මුදියන්සේලාගේ රන්දික නුවන් ජයරත්න සහ සුබසිංහ ගමාච්චිගේ ආනන්ද සුබසිංහ

2016 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. මනිවන්නන් විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2014 අගෝස්තු මස 12 වැනි දින සහතික කළ අංක 6532 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගම්තිහේ මුදියන්සේලාගේ රන්දික නුවන් ජයරත්න සහ සුබසිංහ ගමාච්චිගේ ආනන්ද සුබසිංහ

ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අසූහත් ලක්ෂ අනූදෙදහස් පන්සිය පනස්නමයයි ශත හතලිස් නමය (රු.8,792,559,49) ක මුදලක් 2015 නොවැම්බර් 30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 8,792,559.49 ක මුදල අයකර ගැනීම සඳහා 2015 දෙසැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 6532 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතලය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ඊ 350 සී කළුදාවල ග්‍රාම නිලධාරි වසමේ මාතලේ නගරයේ මහනගර සභා සීමාව තුළ මාතලේ කළුදාවල හි පිහිටි කිවෙල් වතුයායේ ඉහල කොටසේ නැමැති ඉඩමට මාතලේ බලයලත් මිනින්දෝරු ඩී. ආර්. එම්. ඩී. බණ්ඩාර විසින් 2014 මැයි මස 16 වැනි දින මැන සාදන ලද එකී අංක 254 දරන පිඹුර ප්‍රකාර ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් ඊසානට : එම ඉඩමේම කොටසකින් ද බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් මැන සාදන ලද අංක 909 දරන පිඹුරේ ලොට් 2 මගින් ද, දකුණට : කළුදාවල වතුයායෙන් ද, ගිණිකොණට : එස්. පාක්කියම් සහ අනිකුත් අය හිමිකම් කියන ඉඩමෙන් ද සහ වයඹට : අඩි විස්සක් (20) පළල ප්‍රවේශ මාර්ගයෙන් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් දහතුනයි දශම හතරයි පහ (අ. 0, රූ. 1, පර්. 13.45) ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමඟ ඒ මත පිහිටි ගොඩනැගිලි සහ මාතලේ - රත්තොට ප්‍රධාන මාර්ගයේ සිට නිවාස දක්වා දිවෙන අඩි විස්සක් (20) ක් පළල පාරේ අංක 254 දරන පිඹුරේ උතුරු දෙසින් වන ප්‍රවේශ මාර්ගය වාහන සහ අඩි පාරක් සඳහා සම්පූර්ණ පරිහරණය කිරීමේ අයිතිය ද සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-500/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.